# 51

# ජීවිතය කළමණාකරණය කරගැනීමෙහිලා සෞන්දර්යය

ආචාර්ය ජයලත් මනෝරත්න

පළමුවෙන්ම අද දිනය ඔබට මෙන්ම මටද අතිශය ප්‍රීතිදායක සහ අමරණීය දිනයක් වන බව ප්‍රකාශ කළ යුතුය.

මෙම රමණීය සරසවි පියස තුළ සිව් වසරක් මුළුල්ලේ අපමණ කැපකිරීම් සහ වෙහෙස මධ්‍යයේ, ශාස්ත්‍රීය සහ විද්‍යාත්මකව, කළමනාකරණය නම් වූ විශේෂිත විෂයය හදාරා ඒ සම්බන්ධව ප්‍රාමාණික දැනුමක් මෙන්ම ගෞරවනීය උපාධියක්ද ලබමින්, හෙට සිට නැවුම් සමාජමය ජීවිතයකට පියවර තැබීමට උදාවන භාග්‍යය ඔබේ සතුටයි. එමෙන්ම මෙබඳු අතිශය ගාම්භීර උත්සවයක් හමුවේ ඔබ වෙනුවෙන් දේශනයක් පැවැත්වීමට මා ලද ගෞරවණීය ආරාධනය මගේ සතුටයි. ඒ පිළිබඳව මගේ ප්‍රණාමය සහ උත්තමාචාරය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පිරිනැමීමට අවසර.

දේශනශාලාව තුළ කළමනාකරණය සහ වාණිජ විද්‍යාව සාර්ථකව හැදෑරූ ඔබට, හෙට සිට සමාජය නමැති සංකීර්ණ පරිසරය තුළදී ජීවිතය සාර්ථකව කළමනාකරණය කරගැනීමට සිදුවෙන බව පැහැදිලිය. එනම්, හෙට සිට ඔබ තවදුරටත් ශිෂ්‍යයෙක් හෝ විද්‍යාර්ථියෙක් නොව සමාජ වගකීම් සහිත, යම් ප්‍රභූත්වයකින් පිළිගනු ලබන පූර්ණ පුරවැසියෙක් බවට පත්වන බැවින්මය.

ජීවිතය මනාව කළමනාකරණය කරගැනීම පිණිස ප්‍රධාන වශයෙන් අපට අනුප්‍රාණය සලසනු ලබනුයේ ආගම - ධර්මය හෝ දර්ශනය විසින් බව පිළිගත් කරුණකි. බුදුරජාණන් වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, මුහම්මද් නබි නායකතුමා වැනි ආගමික ශාස්තෘවරුන්, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, නීට්ෂේ, බර්ට්‍රන්ඩ් රසල්, කෘෂ්ණමූර්ති, ලුහුෂුන්ග් වැනි දාර්ශනිකයන් විසින් කරන ලද දේශනයන්, ප්‍රකාශනයන් අත්වැල් කරගනිමින් අපගේ ජීවන රටාව මනාව සැලසුම් කරගත හැකි බව නොරහසකි.

මේ හැරුණුකොට ජීවිතය ඵලදායි සහ අර්ථපූර්ණව, කලමනාකරණය කරගැනීමට පිටිවහල් වන තවත් විශේෂිත මූලයක් වශයෙන් කලාව, සාහිත්‍යය සහ සෞන්දර්යවේදය හඳුනාගත හැකිය. කලාව යනු කුමක්ද? එය කෙලෙස උත්පාදනය වීද? එහි අරමුණු කවරේද? එය හුදු විනෝදාස්වාදය උදෙසා පමණක්මද? නැතහොත් මානව සමාජයේ උන්නතිය හෝ උත්තරීතරභාවය උදෙසාද? අලුත් මිනිසෙක්, අලුත් සමාජයක්, අලුත් ලෝකයක් ගොඩනැංවීම වෙනුවෙන් එහි දායකත්වය කවරේද? වැනි ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කිරිමෙන් ඒ පිළිබඳව යම් අවබෝධයක් ලබාගත හැකිය.

එහෙත් මෙය සරල ක්‍රියාදාමයක් සේ සැලකිය නොහැක. ඒ කලාව යනු අතිශය සංකීර්ණ, ගැඹුරු, පුළුල් විෂයයක් වනවා පමණක් නොව මූලාරම්භයේ පටන්ම එහි අරමුණු හා නිර්වචන වරින්වර විවිධ අරුත් ගැන්වුණු නිසාමය.

අප වෙසෙන පෘථිවියේ වයස අවුරුදු මිලියන හාරදහස් හයසීයයක් පමණ වන බව භූගර්භ විද්‍යාඥයන්ගේ අදහස යි. මිනිස් වාසය සඳහා පෘථිවිය සැකසුනේ ඊටත් අවුරුදු මිලියන ගණනාවකට

පසුවය. ඒ අනුව බලනවිට වර්තමාන මිනිසාගේ වයස අවුරුදු විසි ලක්ෂයක් පමණ විය හැකි යැයි අනුමාන කළ හැකිය.

මෙසේ උත්පාදනය වී ඉදිරියට විකාශනය වූ මානව වංශකතාවේ වැදගත් පාර්ශවයන් දෙකක් වනුයේ ක්‍රියාකාරකම හා චින්තනයයි. හුදු ජීවත්වීම උදෙසා ක්‍රියාත්මකවූ මානවයාගේ ශරීරය, ආහාර, නවාතැන, වස්ත්‍ර ආදිය ලබාගැනීම සඳහා යෙදවුණු අතර, කාලානුරූපව විවිධ අවශ්‍යතා මත ඒ ඔස්සේ යම් අනුකරණ ක්‍රියාවලියක්ද හටගත් බව අනුමාන කළ හැකිය. විශේෂයෙන් එය භෞතික ලෝකයේ තමාට පාලනය කරගත නොවුණු බලවේග උදෙසා හෝ පාරභෞතික ලෝකය තමන් වෙත පමුණුවන උවදුරු - ලෙඩරෝග - භය භීතිකා උදෙසා දක්වන ලද ප්‍රතික්‍රියා අනුසාරයෙන් උපදින්නට ඇත. නැතහොත් දඩයම ආදියේදී සතුනගේ හා තමන්ගේ ක්‍රියාකාරකම් ගෝත්‍රයේ අනෙකුත් අයට කියාපෑම සඳහා සන්නිවේදන මාර්ගයක් ලෙස අනුකරණය යොදාගත්තා විය හැක. කෙසේ වෙතත් පසුකාලීනව මෙකී අනුකරණය, රිද්මයානුකූලව සහ නාදානුරූපීව යොදා ගැනීමෙන්, එය නිර්මාණාත්මක කලාවේ මුල් බීජුවට හා සබඳතාවක් දක්වතැයි උපකල්පනය කිරීමටද අපහසුවක් නොමැත. මිනිස් ශ්‍රමය භාවිතයට ගැනීම සහ කලාවේ උපත පිළිබඳ සහසබඳතාවද මෙම ඓතිහාසික මූලධාතු අතර කෙනෙකුට ගවේෂණය කළ හැක.

දෙවැනි වැදගත් සාධකය වන චින්තනය, කලාවේ උපත ගැන සොයා බැලීමේදී වැඩි ප්‍රතිශතයක් අත්කරගන්නා බව ඉතා පැහැදිලිය. තමා අවට ලෝකය විසින් පෙන්වා දෙනු ලැබූ සොබාදහමෙහි අනුභාවයෙන් සෞන්දර්යාත්මක චින්තනයක් කරා මෙහෙයවීමේ ප්‍රතිඵල මිනිසාට ළඟාකර දෙන්නට ඇත.

අනෙකුත් සත්ත්ව කොට්ඨාශයන්ගෙන් මානවයා, වෙනස්වන මූලික සාධක වශයෙන්, ශ්‍රම හැකියාව, චින්තනය සහ අදහස් සන්නිවේදනය කරගැනීමේ භාෂාමය හැකියාව පෙන්වා දිය හැකිය. කලාව හෝ සෞන්දර්යාත්මක ප්‍රකාශනයන් බිහිකිරීමෙහිලා මිනිස් මොළයේ මෙම විශේෂිතවූ ගුණය හා හැකියාව අනුප්‍රාණය සලසන්නට ඇතැයි සිතීම විවාද රහිතය.

කලාව හෝ සෞන්දර්යවේදය මිනිසාගේ නිර්මිතයක් නොව, දෙවියන් විසින් දෙනු ලැබූ දායාදයක්ය යන ප්‍රවාදයද මෙහිලා සිහිපත් කළ යුතුය. කලාව පමණක් නොව මිනිසාද දෙවියන්ගේ මැවුමක්ය යන විඥානවාදී අදහස අභියෝගයට ලක්වනුයේ, චාල්ස් ඩාවින් ප්‍රමුඛ විද්වතුනගේ පරිණාමවාදය පිළිබඳ ගවේෂණයන් සමඟමය. විද්‍යාත්මකවත්, ඓතිහාසික සාධක අනුවත්, තාර්කිකවත් මිනිසා බිහිවූයේ ජීව පරිණාමයේ එක් සන්ධිස්ථානයකදී වානර ප්‍රභේදයකින් බව එහිලා සාක්ෂාත් විය. මිනිසා බිහිවූයේ පරිණාමීය ක්‍රියාවලියක් ලෙස නම්, කලාවද එම පරිණාමීය ක්‍රියාවලියේම ප්‍රතිඵලයක් යැයි සිතීමට බාධාවක් නොමැත.

කෙසේ වුව, ලොව පුරා ස්වභාව ධර්මය විසින් එනම්, ප්‍රකෘතිය විසින් නිර්මාණය කළ දෙයට අමතරව යම් නිර්මාණයක් වේ නම් ඒ මිනිසාගේ ශ්‍රමයේ සහ චින්තනයේ ප්‍රථිඵලයන් බව නොරහසකි. ස්වකීය හැඟීම් හෝ අත්දැකීම් අන් අයට සම්ප්‍රවේශණ කිරීමෙහිලා භාවිත කළ විවිධ අනුකරණ නොයෙක් මාධ්‍යයන් කරා වර්ධනය වී කලාවේ මූලික හැඩතල සපයා දෙන ලදී. ස්පාඤ්ඤයේ අල්ටමීරා පෙදෙස්හි වසර 25000 ක් පමණ පැරණි ගුහා චිත්‍ර, වසර 17000 ක් පමණ පැරණි ගිණිකොණදිග ප්‍රංශයේ ලැස්කෝ ගුහා චිත්‍ර මෙන්ම, පැරණි ලංකාවේ පාරු කවි, නෙළුම් කවි, කරත්ත කවි, පැල් කවි, ආදී ශ්‍රමය මුදාහැරීමේ දී මතුවන වෙහෙස දුරුකරගත් ප්‍රකාශනද එබඳු මතවාදයක් වෙනුවෙන් සැපයිය හැකි මනා නිදසුන්මය.

කලාවේ උපත පිළිබඳව වූ බොහෝ මතවාද එලෙස තිබියදී එහි අරමුණු කවරේදැයි මඳ වශයෙන් හෝ විමසීම කලාව ජීවිතය කළමනාකරණය කර ගැනීමෙහිලා දක්වන දායකත්වය සාකච්ඡා කිරීමට තවත් පිටිවහලක් සපයනු නොඅනුමානය. පෙරදිග ඉන්දියාවේදී භරතමුනිතුමා ප්‍රකාශ කළේ, කලාවේ අරමුණ රස ජනනය කිරීම වශයෙනි. අපරදිග ග්‍රීසියේදී ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේ, විශේෂයෙන් නාට්‍ය කලාව වූකලී විකාශනය වන යම් කාර්යයක් අනුකරණය කිරීම වශයෙනි.

කලාව වනාහී සංස්කෘතියේ සංකේතාත්මක ප්‍රකාශනයකි යනුවෙන් විස්තර කළේ මාක්ස්වාදී සෞන්දර්ය විද්‍යාඥයන් විසින්ය. මාක්ස්ට අනුව කලාව වනාහි භෞතික ලෝකය පිළිබඳ සමාජ යථාර්ථවාදී ප්‍රකාශනයකි. වෙනත් කෝණයකින් එයම විශ්ලේෂණය කළහොත්, ප්‍රකෘතිය හෙවත් ස්වභාවධර්මය සෞන්දර්යාත්මක ලෙසින් මිනිස් මනසේ පිළිබිඹුවීම කලාව වශයෙන්ද අර්ථකථනය කළ හැකිය.

රුසියානු මහා ගත්කතුවර ලියෝ ටෝල්ස්ටෝයි අනුව, කලාව වූ කලී එක් අයෙකු සිතාමතාම යම් බාහිර සලකුණු උපයෝගී කරගෙන, අන්‍යයන් ආසාදනය වන සේ, ස්වකීය වේදිතයන් අන්‍යයන් තුළ ජනිත කරවන  මානව ක්‍රියාවලියකි. එනම්, යමෙකු යම් වේදිතයක් විඳගැනීමෙන් පසු චලන, රේඛා, වර්ණ, ශබ්ද හෝ වචන සංයෝග මගින් ඒ වේදිතයම අන්‍යයන් තුළද දැනවීම කලාවේ කාර්යය බවයි.

විසිවැනි සියවසෙහි ප්‍රකට බටහිර විචාරක අයි.ඒ. රිචර්ඩ්ස් සඳහන්  කළ පරිදි, කලාව වූ කලී සන්නිවේදන කාර්යයයේ උපරිම අවස්ථාවකි. මෑත කාලයෙහි ලොව බිහිවූ අග්‍රගණ්‍ය චිත්‍ර ශිල්පියකු වන පැබ්ලෝ පිකාසෝ, ඍජුව නොවුණද කලාවෙහි අරමුණු මෙලෙස සංකේතවත් කර ඇත. ''මා අඳින්නේ මා දකින දෙය නොව, මා දකින දෙය ගැන මා සිතන ආකාරය යි.''  ලොව විශිෂ්ට පෙළේ සිනමා අධ්‍යක්ෂවරයකු වශයෙන් සැලකෙන ඉන්ග්මාර් බර්ග්මාන් ද කලාව පිළිබඳ ව්‍යංග්‍යාර්ථයෙන් පළ කරන්නේ මේ අයුරිනි. ''ජීවිතය මුලින් ගොඩ නගන්න, ඉන්පසුව කැමරාවට ඇහැ තබන්න...''

විසිවැනි සියවසෙහි මෙරට පහළවූ ප්‍රශස්ත කිවියර මහගම සේකර, 'ප්‍රබුද්ධ' කාව්‍ය  ප්‍රබන්ධයේදී කලාව පිළිබඳව ඉදිරිපත් කරන සංකල්පනාව මෙබඳුය.

'බුදු සමිඳුනි කුමක් නිසා
ඔබ කලාව අත්හළෝද ?

කලාව, සත්‍යය හා මිථ්‍යාවය.
සත්‍යය ප්‍රකෘතිය ය.
ප්‍රකෘතිය තරම් සුන්දර වූ කිසිවක්
කිසි දවසක මිනිසාහට මැවිය නොහැක.
ඒ සුන්දර බව හරි හැටි දක්නට බැරි
දුහුනන්ටය කලාව....'

මෙම බොහෝ ප්‍රකාශන තුළ ගැබ්වන එක් විශේෂිත පොදු පාදමක් වෙයි. එය නම් කලාව යනු ජීවිතයම යන්නයි.

මේ හැරුණුකොට කලාව පිළිබඳව ලෝක ඉතිහාසය පුරාවට විසිරුණු විවිධ අදහස් රාශියක්ද තිබෙන බව සිහිපත් කරගත යුතුය. කලාව ජීවනය සඳහාය. කලාව ජීවනයේ කම්කටොළුවලින් ගැළවී සිටීම සඳහාය. කලාව කම්කටොළුවලින් නොසැලී, එයින් විනෝදය ලබනු සඳහාය. කලාව

සේවය සඳහාය. කලාව ආත්මානුභූතිය සඳහාය. කලාව විනෝදය සඳහාය. කලාව ඉන්ද්‍රිය ප්‍රීණනය සඳහාය. කලාව කලාව සඳහාය.

සිව් වසරක් මුළුල්ලේ ඔබ ප්‍රගුණ කළ කළමණාකරණ විෂය ධාරාව කලා අංශයට මෙන්ම විද්‍යා අංශයටද අදාළ වේ යැයි මම අනුමාන කරමි. එය හැඳින්වෙන්නේද කළමනාකරණ අධ්‍යයනය සහ වාණිජ විද්‍යාව වශයෙනි. ජගත් ලේඛක ලියෝ ටෝල්ස්ටෝයි සටහන් කළ වාක්‍ය දෙකක් මෙහිදී මා මතකයට පිවිසෙයි. 'කලාව හා විද්‍යාව පෙනහළු සහ හෘදය වස්තුව මෙන්ම බෙහෙවින් ඒකාබද්ධවී පවතී. යම් එක් ඉන්ද්‍රියයක් අකර්මණ්‍ය වුවහොත්, අනෙක් ඉන්ද්‍රියටද තත්ත්වාකාරයෙන් ක්‍රියාකාරී විය නොහැකිය...' ඉදින් කලාව සහ විද්‍යාව අන්‍යොන්‍යතයෙන්ම එකට බැඳී ඇති බවට වෙනත් නිදසුන් කුමකටද?

ජීවිතය කළමනාකරණය කරගැනීම උදෙසා කලාව භාවිත කිරීමේ ශක්‍යතා කවරේදැයි විමසන්නකුට ඒ තුළ ගැබ්වන විවිධ වර්ගීකරණ වැදගත් වෙයි. ලලිතකලා සහ උපයෝගීතා කලා වශයෙන්, ප්‍රාකෘතික කලා, ජන කලා, වාණිජ කලා වශයෙන්, නූතන කලාව අමූර්ත කලා, දෘශ්‍ය කලා වශයෙන් වන වර්ගීකරණ ඒ අතරවේ.

කෙසේ වුව දෘශ්‍ය කලාව යටතේ එන චිත්‍ර, මූර්ති, කැටයම්, ඡායාරූප සහ වාස්තු විද්‍යාවේ යම් ශ්‍රේෂ්ඨ අංගෝපාංග ද, ප්‍රාසංගික කලාව යටතේ එන නර්තනය, සංගීතය, නාට්‍යය, සිනමාව ආදී මාධ්‍යයන් ද, සාහිත්‍යය යනුවෙන් සැලකෙන ගද්‍ය යටතේ එන නව කතා, කෙටි කතා ආදිය සහ පද්‍ය යටතේ එන ගී කාව්‍ය, සිලෝ, සිව්පද, නිදහස් ආදී වූ ආකෘතීන්ද සමස්ත කලාව යන සංකීර්ණ විෂයපථයට අඩංගුය. එනමුදු මෙය වුව පරිපූර්ණ වගුවක් නොවේ. විශේෂයෙන් නූතන තාක්ෂණය හා වැඩිදියුණුවූද පරිගණකය, ජංගම දුරකථනය ඔස්සේ පවා කලාත්මක භාවිතාවන් නිරූපණය වන නිසාය.

මෙම සියලු කලා මාධ්‍යයන්ගෙන් සිදුවනුයේ යම් සන්නිවේදන ක්‍රියාවලියක් බව ඉතා පැහැදිලිය. එනම් කෙනෙකුගේ අත්දැකීමක් තවත් බොහෝ දෙනා අතර බෙදා හදා ගැනීමකි. එම අත්දැකීම බොහෝවිට තමන්ගේම අත්දැකීමක් විය හැකි වුවත්, ඇතැම්විට අන්‍යයෙකුගේද විය හැකියි. එසේත් නැති වුවොත් උපකල්පනය කරන ලද අත්දැකීමක්ද විය හැකියි. අත්දැකීම් බෙදාහදා ගැනීම අප සාමාන්‍ය ජීවිතයේ සුලබ කරුණක් බව සැබෑය. මළගෙයකදී, මඟුල් ගෙයකදී, කඩ පොලේදී, මහමඟදී, නිවෙස තුළදී කවර ස්ථානයක තමා ලැබූ අත්දැකීම අන්‍යයන් වෙත පමුණුවාලීම් හෝ බෙදාහදා ගැනීම අතිශය සාමාන්‍ය චර්යාවකි. එය සමාජයක් පවත්වාගෙන යාමේ මූලික සාධකයක්ද වෙයි.

කලාව විෂයයෙහි දී මෙම ක්‍රියාවලියේ වෙනස නැතහොත් විශේෂත්වය වනුයේ මෙම සන්නිවේදනය සෘජුව සිදු නොවීමය. එනම්, වාර්තා ස්වරූපයෙන් නොවීමය. කලා මාධ්‍යයන් ඔස්සේ එකී අත්දැකීම් අන්‍යයන් වෙත පිරිනැමෙනුයේ ව්‍යංගයෙනි, වක්‍රෝක්තියෙනි. වෙනස් ස්වරූපයකිනි. භාවයන් රස බවට පෙරළීමෙනි, යම් චමත්කාරයකිනි. ඉතා කෙටියෙන් පවසතොත් 'අත්දැකීමකට හැඩයක්' ලබාදීමෙනි, සෘජුව නොවීමෙන් මෙම හැඩය ඒ ඒ මාධ්‍යයන්ට අනුව වෙනස් ස්වරූපයක් ගන්නා අතරම, හැඟීම් සහ සංවේදනා පුබුදුවාලීම නිසාම යම් කම්පනයක් ඇති කරලීම විසින් පුද්ගලයාද වෙනත් අයෙකු බවට පරිවර්තනය කරවනු ලබයි. මෙහිදී සාමාන්‍ය ප්‍රේක්ෂකයා හෝ පාඨකයා හෝ ග්‍රාහකයා, 'රසිකයකු' බවට පරිවර්තනය වීම සැබෑ කලාවේ නියතියකි.

මෙහිදී අවධාරණය කළ යුතු වැදගත් කරුණක් වනුයේ, කලාකරුවා විසින් ප්‍රදානය කරනු ලබන අත්දැකීම සාමාන්‍ය එකක් නොවිය යුතුය යන්නය. එනම් අප උදේ සිට රාත්‍රී වනතුරු ලබන්නේ අත්දැකීම්ය. ළමා කල සිට වියපත් කල දක්වා ලබනුයේ අත්දැකීම්ය. එහෙත් මේ සියලු අත්දැකීම්,

අන්‍ය සියලු දෙනාට වැදගත් නොවනු ඇත. එසේ නම් කලාකරුවා තෝරාගත යුත්තේ, විශේෂිත, තියුණු, සංවේදිත, අපූර්ව අත්දැකීම් පමණක් බව පැහැදිලිය. ජීවිතයේ තමන් ලැබූ තියුණු අත්දැකීමක්, එනම් ඇස, කණ, සම, නාසය, දිව කියන පංචේන්ද්‍රියන්ගෙන් ලැබෙන අත්දැකීමක් මනස විසින් සංකලනය කිරීමෙන් ලබන අනුභූතිය, පරිකල්පනය මගින් නව මුහුණුවරක් දී කලාකරුවා, සාහිත්‍යකරුවා විසින් අපූර්ව නිර්මාණයක් බවට පත්කරවනු ලබයි.

අපූර්ව යනු පෙර නුවූ විරූ යන අදහසය. මීට පෙර නොඇසූ නොදුටු මෙසේ අමුතු දෙයක් දකින තැනැත්තා පළමුවෙන්ම විස්මයට පත්වෙන බව කිව හැකිය. ඊළඟට ඔහු භයානක රසය හෝ හාස්‍ය රසය හෝ කරුණ රසය විඳගනියි. මේ සියලු රසයන්ගේ හරය චමත්කාරයයි. චමත්කාරය යනු සිත පුරවා දමන විස්මය මිස අන් කිසිවක් නොවේ, යනුවෙන් මහාචාර්ය සරච්චන්ද්‍ර 'කල්පනා ලෝකය' ග්‍රන්ථයේදී සඳහන් කරන්නේ ඒ නිසාම විය හැකියි.

ඕනෑම නාට්‍යයක්, ඕනෑම චිත්‍රපටයත්, ගීතයක්, කවියක්, නවකතාවක්, කෙටිකතාවක් වස්තු විෂයය කරගනුයේ අත්දැකීමක් බව පෙරදීත් සඳහන් කළෙමි. එය තමයි අන්තර්ගතය, එනම් කිව යුතු දෙය හෙවත් අත්දැකීම. කිවයුතු ආකාරය තමයි ආකෘතිය, නැතිනම් ස්වරූපය නමින් හඳුන්වන්නෙ. කියන දෙයක් තියෙනවා. කියන විදියක් තියෙනවා. අන්තර්ගතය සහ ආකෘතිය එනම් අත්දැකීම සහ හැඩය.

අන්තර්ගතයෙහි යම් අර්ථයක් ගැබ් වෙන අතර, ආකෘතියෙහි යම් රසයක් ගැබ් වෙයි. අර්ථය අපේ බුද්ධිය ආමන්ත්‍රණය කරන අතර, රසය අපේ මනෝභාවයන් පුබුදුවාලයි. අර්ථය සංජානනීය වන අතර රසය සංවේදනීය වෙයි. මේ අනුව උසස් කලා නිර්මාණයක්, සාහිත්‍ය නිර්මාණයක් සේවනය කරන පුද්ගලයා අර්ථය හා කැටිවූ රසයක් විඳගැනීමට ප්‍රස්තාව උදාකර ගනියි.

බොහෝවිට අත්දැකීම නැතහොත් අන්තර්ගතය සමාජය පිළිබඳව ජීවිතය පිළිබඳව යථාර්තයක් නැතහොත් සත්‍යයක් විය හැකිය. එසේම එම සත්තාව ප්‍රක්ෂෙපණය කෙරෙන ආකෘතිය යම් රමණීයත්වයකින් අලංකාර වන බවද පැහැදිලිය. සත්‍යය සහ රමණීයත්වය. Truth and Beauty.

මේ නිසා යථාර්ථවාදී හෝ ස්වභාවවාදී කලාකරුවා, අතින් සත්‍යය වඩාත් රමණීය සහ පරිපූර්ණ ලෙස ඉදිරිපත්වන බවට මතයක් පවතින අතරම. අනෙක් අතට කලාව සහ සත්‍යය අතර සම්බන්ධයක් අවශ්‍ය නොවන බවටද මතයක් ඇති බව පෙනෙන්නට ඇත. සත්‍යයද සාපේක්ෂ ධර්මතාවක් නිසා සත්‍යය කුමක්දැයි ඒකමතික පිළිගැනීමක් නැති බැවිනි. උදාහරණ ලෙස යම් ආගමක් හෝ, විශ්වාසයක් කෙනෙකුට සත්‍ය වන අතර, තව කෙනෙකුට එසේ නොවිය හැකියි. නැතිනම් එක් කලෙක සත්‍යය යැයි පිළිගැහුණු දෙයක් පසුව සාවද්‍ය බවට ඔප්පු විය හැකිය. කෙසේ වෙතත් කලාව විෂයයෙහි සත්‍යය රඳා පවතින්නේ එය නිර්මාණය කරනු ලබන්නාගේ පිළිගැනීම මත බව සිතාගත හැකිය. අනෙක් අතට කලාවෙන් ඉදිරිපත් වන්නේ පෞද්ගලික සත්‍යය නොව පොදු හෙවත් සමාජ සාධාරණ සත්‍යය බවද සිහිපත් කරගත යුතුය.

ඉදින්, ජීවිතය කළමනාකරණය කරගැනීමේලා කලාව හෝ සාහිත්‍යයේ දායකත්වය කවරේද? කලාව විනෝදාස්වාදය සඳහා පමණක්ද ? අප නාට්‍යයක්, චිත්‍රපටයක් නරඹන්නේ කුමක් අරමුණු කරගෙනද? කෙටි කතාවක්, කවියක් කියවන්නේ කුමක් සඳහාද ? ගීතයක්, සංගීතයක් ශ්‍රවණය කරන්නේ කවර අවශ්‍යතාවක් මතද? වැනි ගැටළු මතුවන්නට පුළුවන.

මෙයට සෘජු පිළිතුර විනෝදය සඳහා යැයි එක එල්ලේම කිව හැකි වන අතර, සතුට, සන්තෝසය, ආනන්දය වැනි පිළිතුරුද තිබිය හැක. එම පිළිතුරුවල කිසිදු වරදක් දැකිය නොහැක්කාක් මෙන්ම එහි අවංකභාවය පිළිබඳවද සැකයක් ඇතිවිය නොහැක. එසේද වුවත් එය හුදු විනෝදය උදෙසා

පමණක්මද? යන්න විමසා බැලීම උචිතය. එය පළමු අරමුණ විය හැක. දෙවැනි හෙවත් වැදගත්ම අරමුණ වන්නේ මෙම විනෝදාස්වාදය ඔස්සේ ජීවිතයට ලැබෙන අලුත් අත්දැකීමය. අලුත් දැනුමය. අලුත් දැක්මය. අවසාන විග්‍රහයේදී ප්‍රඥාවේ නිම්වළලු ප්‍රසාරණය වීමය.

කලාකෘතියක් ඔස්සේ මෙය සිදුවනුයේ ව්‍යංගයෙන්, වක්‍රෝක්තියෙන් හෝ අවිඥානකව විය හැකිය. එසේ වුව ජීවන ප්‍රණිධානයා විය යුත්තේ උත්තම කලාකෘතියකින් ලබන මෙම විශිෂ්ට ගුණාංගය බව පැහැදිලිය.

කලාවේ අරමුණ මේ යැයි ස්ථිරසාර, ඍජු, තනි පිළිතුරක් සැපයීම එතරම් පහසු කරුණක් නොවන බව විවාද රහිතය. ශතවර්ෂාධික කාලයක් මුළුල්ලේ මේ පිළිබඳව විවිධ මතවාද, තර්ක විතර්ක, විශ්වාස, සංකල්ප මතුවනුයේද ඒ හේතුකොට ගෙනමය. එසේවුව, කලාව විෂයයෙහි පොදු අරමුණ, හුදු විනෝදය පමණක් නොවන බව අද අපගේ කියැවීමය. විනෝදය ඇසුරින්, සෞන්දර්යකාරකයක් ලෙස, චමත්කාරය උත්පාදනය කරමින්, අලුත් අත්දැකීමක්, අලුත් දැනුමක්, අලුත් දැක්මක් පාඨකයා, ප්‍රේක්ෂකයා, ග්‍රාහකයා තුළ තැන්පත් කරමින්, අලුත් මිනිසෙක්, අලුත් සමාජයක්, අලුත් ලෝකයක් බිහිකිරීමේ නව මාවතක් ගොඩනැංවීම උදෙසා අවශ්‍ය ප්‍රඥාව සම්පාදනය කිරීම එහි සාධනීය අරමුණ විය යුතු බව අපගේ කියැවීමය.

'ලෝකය උඩුයටිකුරු කළ නාට්‍යවේදියා' වශයෙන් විරුදාවලි ලත් ජර්මානු ජාතික බර්ට්‍රෝල්ඩ් බ්‍රෙච්ට් මෙම කාරණය කැටිකරමින් නිර්මාණය කළ කාව්‍යමය ආත්ම ප්‍රකාශනය දෙස මඳකට සිත් යොමු කරනු මැන.

'... මිනිසුන් අවදි නොකරන්නේ නම්
ඒ සංගීතයෙන් අපට කවර නම් පලක්ද ?
දයාවේ පණිවිඩයක් නැත්නම්
ඒ කාව්‍යය එපාමැයි
ජීවිතයට මාර්ගයක් නොකියන්නේ නම්
පිටුදකිමු ඒ නවකතාව.
ක්‍රියාවට මඟක් නොපෙන්වන්නේ නම්,
විරුද්ධවෙමු අප ඒ නාට්‍යයට ....'

මෙම කෙටි දේශනය අවසන් කිරීමට පෙර, එහි සම්පිණ්ඩනයක් ලෙස, කලාකරුවකු ලබනා විශේෂිත, තියුණු අත්දැකීමක්, නිර්මාණකරණය දක්වා විකසිත වූ එක් අවස්ථාවක් මෙම ගෞරවනීය සභාව ඉදිරියේ තැබීමට මට අවසර දෙන්න.

**''අද දින ශ්‍රී ලාංකික සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි අග්‍රගණ්‍ය කවියෙකු, ගී පද රචකයකු ලෙස සම්භාවනාවට පත්වන, රත්න ශ්‍රී විජේසිංහයන් විසින් රචිතව, ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් විසින් ගැයෙන 'සුදු නෙළුම කෝ ....' ගීතයට පාදකවූ සත්‍ය අත්දැකීම සහ එම ගීයෙහි පදවැල් ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කෙරෙයි.''=**

මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී දේශනයක් ඉදිරිපත් කිරීමට ලද ඉඩප්‍රස්තාව මගේ ජීවිතයේද අමරණීය අවස්ථාවක් බව යළිදු සිහිපත් කරමින්, ඒ පිළිබඳ මගේ ගෞරවය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පිරිනමමින්, උපාධි ලබන ඔබ සියලුදෙනාට නීරෝගී සම්පන්න, ප්‍රඥාසම්පන්න සුභ අනාගතයක් පතමි.

<u>*2015.07.28*</u>